**නොච්චියාගම ප්‍රාදේශීය සභාව - 2020**

---

**1 මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) උතුරු මැද පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් 2019 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද අංක 2019/02 දරන චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ක්‍රමයට අනුව ඉදිරිපත් කර ඇති බැවින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තිය ප්‍රකාරව ඉකුත් වර්ෂය සමඟ සැසඳිය නොහැක.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය - 2017 හි 6.20(ආ) අනුව සංක්‍රාන්ති දිනය වූ 2020 ජනවාරි 01 දිනට පැවති වත්කම් ක්ෂය කිරීමේ ප්‍රතිපත්තිය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කර නොතිබුණි. | පිළිගනිමි | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව සංක්‍රාන්ති දිනට පැවති වත්කම් ක්ෂය කරන ප්‍රතිපත්තිය හෙළිදරව් කළයුතු වේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මාසික සාරාංශය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාම පාරිතෝෂික සඳහා රු.885,383 ක් ගෙවිය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.878,094 ක් ලෙස රු.7,289 ක් අඩුවෙන් දක්වා තිබුණු අතර වර්ෂ 05 ඉක්මවූ කාලයක සිට පැවත එන මෙම ශේෂය සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කර නොතිබුණි. | පිළිගනිමි. | නිවැරදි විශ්‍රාම වැටුප් පාරිතෝෂික වටිනාකම ගිණුම්ගත කළයුතු අතර අදාළ පාර්ශවයන් හඳුනාගෙන නිරවුල් කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති 06 කට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සහතික කළ වැඩවල වටිනාකම රු.662,446 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල එය රු.3,960,000 ක් ලෙස දක්වා තිබීම නිසා ණයගැති හා ණයහිමි වියදම රු.3,297,554 කින් වැඩිවී තිබුණි. | පිළිගනිමි. | ව්‍යාපෘති වලට අදාළ සහතික කළ වියදම් අනුව ණයගැති සහ ණයහිමි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 03 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.5,200,968 ක වෙනසක් නිරීක්ෂණය විය. | පිළිගනිමි | උපලේඛනවල නිවැරදි වටිනාකම් සඳහන් කළයුතු වේ. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.49,361,383 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,808,419 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,558,097 ක් වූ හිඟ වරිපනම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී වරිපනම් අයකර ගැනීමට කටයුතු කරමි. | හිඟ වරිපනම් අයකර ගත යුතු වේ. |

(ආ) **කුලී**

-----

| | | |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දින වනවිට අයවියයුතු රු.13,789,360 ක කුලී ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගෙන ඇත. | අයකර ගැනීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතු වේ. |

(ඇ) **බලපත්‍ර ගාස්තු**

-------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.237,740 ක බලපත්‍ර හා සේවා ගාස්තු අයකර ගෙන නොතිබුණි. | ලේඛනගතකර ගාස්තු අයකරගනු ලැබේ. | ලේඛන යාවත්කාලින කර අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

(ඈ) **වෙනත් ආදායම්**

---------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නොච්චියාගම, කුකුල්කටුව, හොරුවිල හා ඉහළවැටියාව ජල ව්‍යාපෘතිවලින් ලැබිය යුතු රු.4,974,837 ක හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම හිඟ අයකර ගැනීමට නිසි වැඩ පිළිවෙලක් නිසි පරිදි ක්‍රියාත්මක කරමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වු කරුණු පහත දැක්වේ .

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

----------------------------------------

### 4.1 පාරිසරික ගැටලු

--------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාව විසින් වර්ගීකරණයකින් තොරව ලබාගන්නා දිරන, නොදිරන සහ ඉලෙක්ට්‍රොනික් කසළ කුසුම්පුර අක්කර 04 ක පමණ විශාල විවෘත භූමියේ ගිනි තැබීම සිදුකරමින් පැවතුණ අතර ගලි රථය මගින් රැගෙන එන ගලි අපද්‍රව්‍ය ද එම භූමියේ විවෘතව බැහැර කරමින් පැවතුණි. | ඉදිරියේදී කසළ විධිමත් ලෙස වෙන්කර ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමි. | කසළ විධිමත් ලෙස බැහැර කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2019 සැප්තැම්බර් මාසයේදී රු.16,938,732 ක වියදමින් ඉදිකරන ලද කොම්පෝස්ට් නිෂ්පාදන මධ්‍යස්ථානය නිශ්කාර්යව පැවතුණු අතර වර්ෂය තුළ රු.1,299,378 ක් දරා රැගෙන එන කසළ කොම්පෝස්ට් අංගනය අසල අක්කර 04 ක භූමියේ ගොඩගසා ගිණි තැබීම සිදුකර තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනය සඳහා අවශ්‍ය, යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන නොතිබුණි. | අවශ්‍ය උපකරණ ලැබුණු පසු විධිමත් ලෙස කසළ කළමනාකරණය සිදු කරමි. | කසළ කළමනාකරණ සඳහා අවශ්‍ය යන්ත්‍ර උපකරණ ලබා ගැනීමට ක්‍රියාකළයුතු වේ. |